SLGURU.LK

සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	13	විෂයය Subject	සිංහල I	කාලය Time	පැය 03

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

✷ *අමතර කියවීම් කාලය ප්‍රශ්නපත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.*

- **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. **පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන අසා ඇති ප්‍රශ්නවලටද (ඌ) සහ (එ) ප්‍රශ්නවලටද පිළිතුරු සපයන්න.**

(අ). එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා **පියසන්** නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලිය කිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාංගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇතිව 'මේ කිඳුරා විද දිවි තොර කොට මෑ හා සමඟ වාසය කෙළෙමි නම් යහපතැ' යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේය. ''සබද චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තවද ආයු ඇතිව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමියි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නො ඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේය.

(i). බරණැස් රජු කිඳුරාට විදින්නට සිතන්නේ ඇයි ?

(ii). බරණැස් රජු කිඳුරාට විදින්නේ කුමන අවස්ථාවකදී ද ?

(iii). ''ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව'' යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv). 'පියසන්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ආ). ඌ තුමූ බා ගොසින් ස්වාමීනි, මාත් ආභරණත් මුබ සන්තක වුව මරන්නේ හැයි ද ? ආභරණත් හැරගත මැනව. මා අතිනුත් මෙහෙ හැරගත මැනවැ'යි කිවුය. ඒ කෙසේ කීවත් නොගිවිස ම මරන්ටම තත්පරව ගත. හැඟිවනු මැනව. මා මියයාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැරගෙන මාගෙනුත් **මිඩිකම්** හැරගත මැනවැ'යි කිවුය. ඒ අසා සොරා එසේ කළ කලට තොපි ගොසින් දෙමව්පියන්ට කියාලව. එසේ කලට අපට විනාසය කරත්මය යි කිවුය. සිටු දුවණියෝ සිතන්නෝ මුගේ කටයුත්තක් ඉතා නපුරු නියා ය. නුවණ නම් ඇතිවන්නා පලාගෙන කන්ට නොවත් ප්‍රයෝජන නිසා වුව. ආදි කුමක් සිතා කුමක් කෙළෙමි නමුත් තමන් කළමනා දෙය දැන් තරයෙක කෙරෙමි.''

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(i). ස්ත්‍රිය බැගෑපත් වන්නේ ඇයි ?

(ii). එම අවස්ථාව මඟහරවා ගැනීමට ඇය කරන යෝජනා මොනවාද ?

(iii). 'නුවණ නම් ඇතිවන්නා පලාගෙන කන්ට නොවත් ප්‍රයෝජන නිසා වුව' යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv). 'මිඬිකම්' යන්නට විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඉ). කලෙක මිහිරි වූ කටහඬින් චිත්‍ර කථිකව ඇවිද්දාහු කලෙක මුගබධිර ඉඟිලාත් ඇවිදිනාමය. කලෙක පුරුෂව ඉපිද ස්ත්‍රීන් පිරිවරා ඇවිද්දාහු කලෙක ස්ත්‍රීව ඉපිද පුරුෂයන්ට පතිනිවත් උපදනාහුම ය. කලෙක ඔවුනොවුන් කෙරෙහි ජීවිත සමාන ප්‍රේමයෙන් ඇවිද්දාහු කලෙක ඔවුනොවුන් **ගෝචර කොටත්** ඇවිදිනාහුමය. අහස බලා අත්පොළසන් දී සත්රුවන් වැසි වස්වාගන්නා තරම් මහාමන්ධාතු සක්විති රජහු පවා කලෙක මිනී ඉස්කබල් ගෙන දොරින් දොර භික්ෂාටනය කොට ගොනකටුකඳ වැදහෙව. දේහ නික්ෂේපය කළාහුමය. මේ ආදි කාරණයෙන් මලණ්ඩ, මේ සසර නම් නුවණැසින් බැලුවානට විඩම්බනාවක් වැන්න.

(i). මෙහි 'මලණ්ඩ' යනුවෙන් ආමන්ත්‍රණය ලබන්නේ කවුද ?

(ii). මෙවැනි පැහැදිලි කිරීමක් කිරීමට හේතු වූ කාරණය කුමක්ද ?

(iii). සක්විති රජහු පවා කලෙක මිනී ඉස්කබල් ගෙන දොරින් දොර භික්ෂාටනය කොට...'' යන්න ලිහිල් බසින් ලියන්න.

(iv). 'ගෝචර කොට' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඊ). ''ඒ ගිය මනුෂ්‍යයන් ස්වර්ණතිලකාවන් කැඳවාගෙන වීථි මධ්‍යයට පැමිණි කල්හි මද නැඟී සිටි මොළ ඇතකු රා පොවා මත් කරවා ඇත් කොහොලින් ඇන **කුප්පවා** ඉදිරියට ලුහුබඳවා ලූහ. එකල්හි රා බී මත් ව කෝපයෙන් සොඬ ගෙන බිම පහරමින් මහත් වූ කුඤ්චනාදයෙන් දසදිග් පුරමින් ඒ ඒ අත මිනිසුන් ලුහුබඳවමින් සෙන පහරක් සේ දිව අවුත් වන්නාවු එ ඇත්තෙම ස්වර්ණතිලකාව දැක එකෙණෙහි උපන්නාවු ස්නේහයෙන් සොඬින් ගෙන ඔසවා තමාගේ කුඹ මත්තෙහි තබා ගත. එපවත් දැක රජකුමරුවෝ නොසතුටු ව එපරිද්දෙන් ස්වර්ණතිලකාව මරා ගත නොහැකි හෙයින් දෙවන දවස් මිනිසුන් යවා රාත්‍රී භාගයෙහි මරවා පීහ. එකල්හි ඒ උද්දාල බ්‍රාහ්මණයා ද ''මෙබඳු ස්ත්‍රී රත්නයෙකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ''යි මහත් වූ ශෝකයෙන් නොයෙක් ප්‍රලාප කිය කියා හඬමින් රාජාංගණයෙහි දරසෑයක් බඳවා ගිනි වැද මළේය.

(i). ස්වර්ණතිලකාව මැරවීමට සැලසුම් කළේ කෙසේද ?

(ii). ස්වර්ණතිලකාව දුටු මොළ ඇතා කළේ කුමක්ද ?

(iii). ''මහත් වූ ශෝකයෙන් නොයෙක් ප්‍රලාප කිය කියා හඬමින් රාජාංගණයෙහි දරසෑයක් බඳවා'' යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv). 'කුප්පවා' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(උ). මෙලෙසින් නොයෙක ව ර
දෙමව්පිය කී මෙහෙ ව ර
නොකළහොත් අනද ර
වෙතියි ඔහුගේ නුගුණ නොසම ර

හිමි තම නැණ නැ වින්
සැදී ගී තරඟ බෙහෙ වින්
වෙණ සිප් **මහණ** **වින්**
කෙළේ ඔහු පරතෙරට මැන වින්

(i). 'නැණ නැවින්' යන්න කවර අලංකාරයකට අයත් වේද ?

(ii). මෙහි සඳහන් ආකාරයට මූසිල වෙණ සිප් ඉගෙන ගැනීමට උත්සාහ ගත්තේ කෙසේද ?

(iii). ''හිමි තම නැණ නැවින්'' යන්න ලිහිල් බසින් ලියන්න.

(iv). 'මහණවින්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

✷ **(උ) සහ (එ) ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.**

(උ). පහත සඳහන් උද්ධෘත අතුරින් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i). ''එ දෑතුරේ දනක් පිනක් කරන්නා නුදුටුම්හ''

(ii). ''දැන් මට පිළිසරණව සංග්‍රහ කරව''

(iii). ''මම ද ඔවුන් හා සමග ගොස් මහණ වෙමි''

(iv). ''මෑ මෙතන ම ඇරපියා යෙමි''

(v). ''උඹ මා ළඟට එව් දෙයියො අන්තරා වෙන්ඩ නොදී උඹ රැක ගනීවි''

(vi). ''මේ පළාතේ කාටත් තියන ප්‍රස්නේ තමයි ඉඩම් ප්‍රස්නේ''

(vii). ''එවැනි කෙනෙකු සමීපයෙහි - සහවාසය දැරිය හැකිද ?''

(ල.3x4=12)

(එ). කවියා යොදාගන්නා කාව්‍ය භාෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් පහත සඳහන් පද්‍ය පන්තිය රසාස්වාදය කරන්න.

රන්තැටියක කඳුළු

මා පමණි ඔබ කැටුව ආවේ
මම ද යමි දියණියනි,
මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුලින්

මෙතෙක් ලොව නො ඇසුව
මියුරු නැළවිලි ගී
ළයට කැටි කොට නිදයි ඔබෙ මව
අවදි වන ඇසි පියෙන්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

බිඳී සුන්වන ලොවක
බිහි නොවූ හෙට දවස
ඇය නොදත් රහස දැන
කාලයේ ගැබ තුළෙහි
ඉකි බිඳියි කම්පාව

දස එකඩ මසක් ඈ රැකි
සෙනෙහසේ නිධානය
වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
නුහුරු බස් තෙපලමින්
වට වෙමින් අඬු නියන්
පැහැර සඟවන අතර
බලා සිටියෙමි කොනක
ගොළු වෙමින් අසරණව

සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩැලි පෙරළන්න
මවගෙ ඇකයෙහි පහස
නොදත් දැරියකි සිඟිති

කිරි ගරුඬ කොත් හෙළන
අඳුරු සෙවණැලි අතර
නුහුරු නුපුරුදු ලොවක
සැතපෙන්න දියණියනි,

මොහොතකින් සඳ ඒවි තනියට
රන්තැටිය පුරවා කඳුළින්,

(ල.12)

02. (අ). ''ග්‍රන්ථකරණය පිළිබඳ විමසීමේ දී දඹදෙණි සාහිත්‍ය යුගයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ.'' විමසන්න.

(ල.07)

(ආ). මිනිස් ලොවේ පවතින සංකීර්ණ චිත්ත ස්වභාවයන් සද්ධර්මරත්නාවලී කතා වස්තුවලින් ද සොයා ගත හැකිය. නිදසුන් සහිතව විමසන්න.

(ල.08)

නැතහොත්

(ආ). සමාජයේ ඒදිනෙදා අපට හමුවන කවර චරිතයක් වුව ද ජාතක පොතෙන් සොයාගත හැකිය. නිර්දිෂ්ට කතා වස්තු ඇසුරින් විමසන්න.

(ල.08)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

03. අ. සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමෙහි ලා සද්ධර්මාලංකාරයෙන් ඉටු වී ඇති කාර්ය භාරය විශිෂ්ටය. නියමිත කතා වස්තු ඇසුරින් විමසන්න.

(ල.15)

නැතහොත්

ආ. පැරණි ලාංකිකයාගේ ජීවන රටාව පූජාවලී කතාවස්තුවලින් අවබෝධ කරගත හැකිය. නියමිත කතාවස්තු ඇසුරින් විමසන්න.

(ල.15)

04. ''සංකල්ප රූප මැවීමෙහි ලා ගුත්තිල කවියා දක්වන්නේ අපූර්ව හැකියාවකි.'' සැණකෙළි වර්ණනාව ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.

(ල.15)

05. ධනය බලය හමුවේ අසරණ වන මිනිසුන් බැද්දේගම නවකතාවෙන් හමුවේ. නවකතාවේ එන චරිත මූලික කරගනිමින් මෙම කියමන විමර්ෂණය කරන්න.

(ල.15)

06. තත්කාලීන සමාජීය ගැටලු කෙරෙහි නූතන කෙටිකතාකරුවාගේ අවධානය යොමු වී ඇත. ''කපිතන්ගේ පුත්තු'' කෙටිකතාව ඇසුරින් නිදසුන් සහිතව විමසන්න.

(ල.15)

07. නූතන කවීහු විවිධ අත්දැකීම් ප්‍රකාශ කිරීමේදී ඊට උචිත කාව්‍ය ආකෘතියක් යොදා ගැනීමට උත්සුක වූහ. නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක්වත් යොදා ගනිමින් ඉහත කියමන විමසන්න.

(ල.15)

08. ''සරත්චන්ද්‍රයන් තුළ සිටි ප්‍රතිභාපූර්ණ කවියා පෙමතෝ ජායති සොකො නාට්‍යයෙන් ඉස්මතු වේ.'' නිදසුන් සහිතව විමසන්න.

(ල.15)

SLGURU.LK
For Educational Purpose Only

“The only person who is educated is the one who has learned how to learn and change.” — Carl Rogers

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved/முழுப் பதிப்புரிமையுடையது

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	13	විෂයය Subject	සිංහල II	කාලය Time	පැය 3.00

අමතර කියවීම් කාලය: මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදාගන්න.

උපදෙස් :

- I කොටසේ I ප්‍රශ්නය ද, II කොටසෙහි 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
- I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරුපත් සමග අමුණා බාරදෙන්න.

I කොටස

1.1 සර්ෂාක්ෂර අන්තර්ගත වරණය තෝරන්න.

(1) ය ර ල ව (2) ඟ ඬ ඳ ඹ (3) ශ ෂ ස හ (4) ඝ ඡ ඪ ධ (5) ඓ ඖ ඇ ඉ

(.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1) නික්ලේෂි, සැණකෙළිය, සඳළුතලය, අවදානම
2) කනිෂ්ඨ, උත්කෘෂ්ඨ, ආධ්‍යාත්මික, පලතුරු
3) ආරණ්‍යය, උණුසුම, ආදර්ශන, පුස්ථකාලය
4) වලාකුළු, සංසරනය,පිළිවෙළ, මැතිනිය
5) ශිෂ්ඨාචාරය, සමස්ත, ස්ථූපය, ධර්මිෂ්ඨ (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

1) උඩගම, පල්ලෙගම, කිරිඳිවැල, මැද්දෙගම
2) බදුල්ල, බණ්ඩාරවෙල, ඇඹරුව, වැලිවේරිය
3) නාගස්වත්ත, යක්කල, නයිවල, යාගොඩ
4) මිල්ලතේ, මැදගම, මිරිගම, මාවතගම
5) කඩවත, කැලණිය,කෑරගල, කිරිබත්ගොඩ (.....)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.

1) (අ)ඃ යන්න විසර්ගය, දීර්ඝ බින්දුව, අනුස්වාරය යන නාමයන්ගෙන්ද හැඳින්වේ.
2) (අ)ඃ සහ හ යන අක්ෂර භාවිතයේ වෙනසක් නැත.
3) (අ)ඃ යන්න වෙනුවට (අ)ං යන්න යෙදිය හැකිය.
4) (අ)ඃ යන්න කන්ඨජ අක්ෂරයකි.
5) (අ)ඃ හල් අක්ෂරයකට පසුව ද යෙදේ. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

1.5 **යංශය, රකාරාංශය, රේඵය, ගයනුකිත්ත,** යන පිල්ලම් අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1) ගද්‍යය, ක්‍රමාංකනය සමපීණය, බෞද්ධ
2) පෞද්ගලික, ප්‍රබුද්ධ, ධාන්‍ය, අනසී
3) සාමුද්‍රිකා, මහෞෂධ, උද්‍යානය, ස්වණී
4) ගෞරවාර්හ, ප්‍රකෘති, සකමී, අව්‍ය
5) ප්‍රමාණ, වාක්‍ය, තකී, චෞර (.....)

1.6 එකිනෙකට **අනුරූපවන සේ** වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1) වෛද්‍ය උපාධිය, තාරකා විද්‍යාව, ස්වර්ග සම්පත්තිය, මිනිස් ශරීරය
2) සැඳෑ සමය, වනිතා කටයුතු, ජනපති මැදුර, රජ සභාව
3) සන්ධ්‍යා ප්‍රවෘත්ති, මූල්‍ය ප්‍රතිපාදනය,මුසු කිරිය, මහ විදුහල
4) ලෝක චාරිත්‍ර, සඳ මඬල, අල්පේච්ඡ දිවිය, සඳ මඬල
5) සමාජ අසාධාරණය, භාණ්ඩ සමීක්ෂණය, අවුරුදු උළෙල, උයන් ක්‍රීඩා (.....)

1.7 **තත්සම පද පමණක්** යෙදී ඇති වරණය කුමක්ද?

1) නිර්මල, නිර්මාණ, නිර්ජල, නිවන
2) පමණ, ශ්‍රමණ, සමාන, විමාන
3) චන්දන, නන්දන, වින්දන, වන්දන
4) විරි, දිරි, පිරි, සිරි
5) වර්ණ, කර්ම, අරණ, ධර්ම (.....)

1.8 **තද්භව වචන පමණක්** අන්තර්ගත වරණය තෝරන්න.

1) මිතුර, උත්තර, කතර, පුවතර
2) සුදු, මුදු, කුදු, බුදු
3) දුක, සෝක, සක, වක
4) කාල, තාල, කැල, මාල
5) සඳ, බඳ, සන්ධ්‍යා, අද්‍යතන (.....)

1.9 **උපමා පූර්වපද, විශේෂණ අපරපද, සංඛ්‍යා පූර්වපද, විශේෂණ පූර්වපද,** යන සමාස අනුපිළිවෙළින් දක්වා ඇති වර්ණය තෝරන්න.

1) යකඩ ගැහැනිය, රතු මල, සදෙව්ලොව, පැරකුම් රජ
2) රතුමල, සදෙව්ලොව, පැරකුම් රජ, යකඩ ගැහැනිය
3) පැරකුම් රජ, රතුමල, සදෙව්ලොව, යකඩ ගැහැනිය
4) සදෙව්ලොව යකඩ ගැහැණිය රතු මල, පැරකුම් රජ
5) යකඩ ගැහැනිය, පැරකුම් රජ, සදෙව් ලොව, රතු මල (.....)

1.10 **කෘදන්තයක් නොවන පදයක්** අන්තර්ගත වර්ණය තෝරන්න.

1) අතුළ ,කළ, මළ, හළ
2) නැටුමන්, බැල්මන්, කෙරුමන්, අවමන්
3) ගයනු, වයනු, දුවනු, පනිනු
4) හැඳිලි, බැඳිලි, කැඩිලි, වැටිලි
5) රැගුණු, බැලුණු, රැඳුණු, දැමුණු (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

1.11 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරින් මුද්‍රිත පද** අයත් වන ක්‍රියාවර්ගය පිළිවෙළින් තෝරන්න.

''**කියව** නොසතුටු වන්ට කාරණ''
''**කියමින්** ගී රස මියුරු''
''යටසින් **බලා** මා දෙස''
''මගෙත් ආයු ගෙන ඔබ ජීවත් **වේවා !**''

1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා
2) පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධික්‍රියා
3) ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
4) විධික්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
5) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, (.....)

1.12 **උපසර්ගයක් යෙදී නැති පදයක්** සහිත පද පේළිය තෝරන්න.

1) දුදන, දුසිල්, දුබල, දුසිරිත්
2) විදේශ, විකුම්, විපුල, විමල
3) සවිස්තර, සළකුණු, සසර, සබඳ
4) අබිදම්, අබිමන්, අකුසල්, අකරණ
5) අනුබල, අනුදැනුම, අනුමත, අනුකරන (.....)

1.13 **නිපාතයක් නොවන පදයක්** අන්තර්ගත වර්ණය තෝරන්න.

1) රඳා, ඉක්බිති, නදා, නිති,
2) වැළි, පුන, නැවත, යළි
3) පිණිස, උදෙසා, වස්, සඳහා
4) ගෙන්, විසින්, කෙරෙහි, කෙරෙන්
5) සෙද, වහා, හනික, සැණින (.....)

1.14 ''**නිලඹර** පුරා **සරන** සියොත්හු **කවිසිත්** නිරතුරු පුබුදු කරත්.'' යන වාක්‍යයේ වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් ඇති පද අයත් වන්නේ කවර ව්‍යාකරණ අංගවලට ද?

1) සන්ධි, සමාස, කෘදන්ත
2) සමාස, සන්ධි, කෘදන්ත
3) කෘදන්ත, සන්ධි, සමාස
4) සන්ධි, කෘදන්ත,සමාස
5) සමාස, කෘදන්ත, සන්ධි (.....)

1.15 **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.

1) තා, අයෙක්, ළමයින්, කතුන්
2) ගොවීහු, වඳුරෝ, කාන්තාවෝ, හාවන්
3) මා, ඇය, දරුවෝ, ඔවුන්
4) ඕතොමෝ, මැණියන්, බුදුහු, කුරුල්ලා
5) දැරියන්, මහල්ලෝ, පියාණන්, පූසන් (.....)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැලපෙන පදයක් ඇති වරණය තෝරන්න.

1) දසකුසල්, දසපනත, තිදොර, පන්සිල්
2) සුරත, මනැසින්, ඇඳුරිඳු, උදරාබාධය
3) සිඟිති, පැනිති, පොඩිති, කැනිති
4) වනමල්, පොල්තෙල්, රටවැසි, දහම්සොඬ
5) රජපිරිස, ළමා පොත්, බුදුගුණ, මවුපිය (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

1.17 **එකම වර්ගයට අයත් සන්ධි පද** පමණක් ඇතුළත් වර්ණය තෝරන්න.

1) ගොක්කොල, වක්කඩ, නාරම්මල, ඇද්දල
2) රඹුක්කන, යක්කු, තපස්සු, උග්ගස්
3) වැල්ලම්පිටිය, වල්ලම්බලම, රුක්කත්තන, ඇද්දෙමට
4) ගිනියම්, දඩයම්, සිතුවම්, සිත්තම්
5) ලිංපඩිය, ගංඉවුර, මිහින්තලය,බුදුකුරු (.....)

1.18 **තද්ධිත නොවන පදයක්** ඇතුළත් පද පේළිය තෝරන්න

1) රන්මුවා, රිදීමුවා, සෙල්මුවා, දැවමුවා
2) වරලස් සිසිලස්, අනුහස්, මුහුලස්
3) දක්ෂතා , ප්‍රබලතා, මෘදුතා, නිපුණතා
4) ප්‍රාදේශීය විද්‍යාලීය කාර්යාලයීය ලාංකේය
5) ගැමි, දැහැමි, සැබි, නැකති (.....)

1.19 ව්‍යාකරණානුකූලව **නිවැරදි වාක්‍යය** තෝරන්න.

1) ඒ පාසලෙහි ගුරුවරුන් නැත.
2) සියලු සිංහලයෝ බෞද්ධයෝ නොවෙති.
3) විශ්‍රාමික ගුරුවරයෙක් වූ චන්ද්‍රසේන මහතා සමාජ සේවකයෙක් ද වෙයි.
4) ළමයි කැටුව යන කාන්තාව අප හා සිනාසුනා ය.
5) කේයස් හෙවත් සාගර පලන්සූරිය සුදෝසුදු කාව්‍යය රචනා කළෝය. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1) ඇත්තට ම ඔබ හෙට එනව ද?
2) දෙවියන් මා ගැන හොඳට බලාගනීවි.
3) ඔවුන් කෙසේ හෝ නව පාසල ගොඩනගනු ඇත.
4) ඇතින් ඇහෙන්නෙ ජය ඝෝෂා හඬයි.
5) විනිසුරුකාරතුමා මට කතා කළා. (.....)

ලකුණු 20

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

II කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉගෙනුම්කරු කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක උපදේශකයා සෑම ඉගෙන ගන්නෙකුගේ ම දැනුම, කුසලතා, රුචිකත්වයන්, ආකල්ප සහ විශ්වාසයන් අනාවරණය කර ගැනීමට ක්‍රම සැලසුම් කළ යුතු ය. ඉගෙනුම් කේන්ද්‍රීය උපදේශකයෝ සිසුන් හිස් පුවරු නොවන බව දනිති. විෂයයක් පිළිබඳ සංකල්පීය අනවබෝධය හෝ වරදවා වටහා ගැනීමට පදනම් වී ඇත්තේ ඔවුන් සමග ගෙන එන අත්දැකීම් බවත් ඔවුහු දනිති. සිසුන්ගේ සමාජ හා සංස්කෘතික සම්ප්‍රදායයන් සහ අත්දැකීම් ඔවුන්ගේ සිතිවිලිවලට ඇතුළත් වේ. එපමණක් නොව, මිනිසුන්ගේ සිතුවිලි සහ විශ්වාසයන් බොහෝ විට නිහඬ ය. එම විශ්වාසයන් මතුපිටට ඇද ගැනීමට සහ ඒවා සුදුසු පරිදි ඉගෙන ගන්නාට, උපදේශකයාට සහ පන්ති කාමර ප්‍රජාවට දෘශ්‍යමාන කිරීමට බොහෝ අවස්ථාවන් නිර්මාණය කිරීම වැදගත් වේ. ශිෂ්‍යයෙකුගේ චින්තනය වඩාත් දෘශ්‍යමාන වන තරමට ශිෂ්‍යයාගේ වැරදි වැටහීම් තේරුම් ගෙන ඒවා නිවැරදි කිරීමට උපදේශකයෙකුට අවස්ථාවක් ලැබේ. මේ ආකාරයෙන්, උපදේශකයාට ශිෂ්‍යයා දැනටමත් දන්නා සහ කළ හැකි දේ මත ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම් ගොඩනගා ගත හැකිය.

ඇතැම් අවස්ථාවන්හි ශිෂ්‍යයෙකුගේ චින්තනය දෘශ්‍යමාන කිරීමට අපොහොසත් වීම ගැටළු සහගත දෙයකි. නිදසුනක් වශයෙන්, සමහර සිසුන් අන්තර්ගතය කටපාඩම් කිරීමේදී හොඳින් සමත් විය හැකි අතර පරීක්ෂණයකදී හොඳින් ලකුණු ලබා ගනු ඇත. එසේ නමුත් ඊළඟ පැවරුම හෝ සාකච්ඡාව අතරතුර ඔවුන් සොයා නොගත් වැරදි වැටහීම් මත පදනම් වූ අදහස් සහ විශ්වාසයන් වෙත ආපසු යා හැකිය. ඉගෙනුම්කරු කේන්ද්‍ර කරගත් පන්ති කාමරයකදී ඉගෙනුම් සහයකයා පාඩම සාර්ථක කර ගැනීමට විෂයය ආශ්‍රිත ගැටළු හෝ අභියෝග සිසුන්ට ඉදිරිපත් කිරීම, ගැටලුව විසඳා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන්ගේ අදහස් ප්‍රකාශනයට ඉඩ දීම, එම අදහස් තුළ ඇති නව චින්තනයට හේතු පැහැදිලි කිරීමට ඔවුන්ට ඉඩදීම යන ප්‍රධාන කරුණු කෙරෙහි සිය අවධානය යොමුකරයි.

ඉගැන්වීම යනු විෂයය කරුණු සහ ශිෂ්‍යයා අතර පාලමක් ගොඩනැගීම ලෙස සංකල්පනය කරන කල ඉගෙනුම් කේන්ද්‍රීය ගුරුවරු පාලමේ කෙළවර දෙකම නිරන්තරයෙන් නිරීක්ෂණය කරති. සෑම සිසුවෙකුම දන්නා, සැලකිලිමත් වන, කළ හැකි සහ කිරීමට අවශ්‍ය දේ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යන අවශ්‍යතා සැපිරීමේදී ගුරුවරුන් ලබා දෙන සහාය නව අවබෝධයන් සඳහා පාලම් ගොඩනැගීමට පදනමකි.

i. ඉගෙනුම් කේන්ද්‍රීය පරිසරයකදී උපදේශකයකුගේ කාර්යභාරය කුමක්ද?
ii. සිසුවෙකු කිසියම් විෂයක සංකල්පීය අවබෝධය දුර්වල වීමට පදනම් වී ඇත්තේ කුමක් ද?
iii. ඉගෙනුම්කරු කේන්ද්‍රීය වූ විට පාඩම සාර්ථක කර ගැනීමට අවධානය යොමු විය යුතු කරුණු තුන දක්වන්න.
iv. ශිෂ්‍යයකුගේ සිතිවිලි සකස්වීමට හේතුවන දේවල් මොනවාද?
v. ශිෂ්‍යයකුගේ චින්තනය වඩාත් දෘශ්‍යමාන වීමේ වැදගත්කම කුමක් ද?
vi. ඡේදයේ දක්වන පරිදි ඉගැන්වීම යනු කුමක්ද?

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශයේ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

'වැව' යන සිංහල වචනය පාලි හා සංස්කෘත භාෂාවල එන 'වාපි' යන්නෙන් බිඳුණකි. පැරණි සිංහල සෙල්ලිපිවල මෙය 'වපි' සහ 'වවි' යනුවෙන් සඳහන් ය. වැව යනු ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ බිහි වූ අති විශිෂ්ටතම නිර්මාණයකි. සංස්කෘතියේ සහ සභ්‍යත්වයේ මාහැඟි සංකලනයකි. වැව යන්න ගත්කල එය මූලික කොටස් කිහිපයකින් සමන්විත වේ. බිසෝ කොටුව, සොරොව්ව, ඇතුළුවාන, පිටවාන, කළිඟු බැමි, වැව් පිටිය ආදී කොටස් ගණනාවක් මෙහිදී හඳුනාගත හැකිය. පුරාණ සිංහලයෝ විශේෂයෙන්ම ජලය පිළිබඳ සැලකිලිමත් වූහ. ඔවුන්ගේ ජීවන අර්ථ ක්‍රමය ගොඩනැඟී තිබුණේ ගොවිතැන මූලික කර ගනිමිනි. එහිදී ගොවිතැන් කටයුතු සඳහා වැයවන ජලය කෙරෙහි ඔවුන් දැක්වූයේ අසීමිත ඇල්මකි. ඉහළ වටිනාකමකි. විශේෂයෙන්ම ආදී සිංහල ජන ජීවිතය පෝෂණය කළ ගොවිතැන ගොඩනැඟුණේ වැව මූලික කර ගනිමිනි.

වැව සමඟ නිර්මාණ වූ වාරි සංස්කෘතිය වනාහි ගැමි ජන දිවියෙහි කොටසක් බවට පත් විය. පුරාණ සිංහල රජ දරුවන් ද ගොඩනැඟිලි ආදිය ඉදි කිරීමට වඩා වැව් තැනීම සඳහා යොමු වූ බව මහාවංශය, චූල වංශය, රාජාවලිය සහ පූජාවලිය වැනි පැරණි මූලාශ්‍රයන් සාක්ෂි දරයි. එමෙන්ම මෙරටට පැමිණි ආර්යයන් සිය ජනවාස පිහිටුවා ගනු ලැබුවේ ද දැඳුරු ඔය, මල්වතු ඔය, මහවැලි ගඟ, මැණික් ගඟ, කිරිඳි ඔය වැනි ගංගා නිම්න ආශ්‍රිතව ය. පුරාණ සිංහල ගම්මාන පවා බොහෝ විට වැවක් කේන්ද්‍ර කොට ගනිමින් ඉදි වූ බව පැහැදිලි ය. වැව ජන ජීවිතයේ මෙන් ම රටෙහි ස්වයංපෝෂණය උදෙසා ද කළ මෙහෙය අපමණ ය. වැව සහ ගම අතර පවතින අවියෝජනීය බැඳීම කෙතරම් ද යන්න පැහැදිලි කර ගැනීමට වැඩිදුර යා යුතු නොවේ.

වාපී තාක්ෂණය එකල විද්‍යාත්මක ව ඉගැන්වීම සඳහා එකල ලංකාවේ පැවති උසස් අධ්‍යාපන ආයතන වන මහා විහාරය හා අභයගිරියෙහි ඉතාමත් උසස් මට්ටමින් පර්යේෂණය පවා සිදු වී ඇත. වැව් ඇසුරු කරගත් ශ්‍රී ලාංකේය වාපී තාක්ෂණය පිළිබඳව අදටත් ලොව මවිතවන පුවත් අසන්නට ලැබේ. මේ කරුණු අනුව ද වැව යනු ඉතා විශ්මයාවහ නිර්මාණයකි. ඉන් ගොඩ නැගුණු අපූර්ව සංස්කෘතියක් ද , ප්‍රබල තාක්ෂණයක් ද අද වන විට පවා ශේෂ ව හෙළයන් අතර පවතී. කාලානුරූපී ව ලෝකයේ ඇතිවන විවිධ වෙනස් වීම්වලදී පවා නොනැසී ආරක්ෂාවුණු මේ විශේෂ සංස්කෘතිය හා තාක්ෂණය අනාගත පරපුර කරා ද රැගෙන යා යුතුය.

(ලකුණු 13)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන (300 350) අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

i. නූතන ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය අධ්‍යාපනය නවීකරණයෙහි අවශ්‍යතාව.
ii. කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම.
iii. හෙළ වෙදකමෙහි වටිනාකම් සමාජයෙහි ප්‍රචලිත කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග.
iv. ශ්‍රී ලංකාවේ දේශපාලනය සඳහා ස්ත්‍රියගේ දායකත්වය කෙබඳුද ?
v. නූතන ගීත සාහිත්‍යය රසික මනසට සිදු කරන බලපෑම කෙබඳු ද?

(ලකුණු 25)

4. (අ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. අප මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ගුරුවරු හමුවීමට යෑම යෙහෙකි.
ii. නදී තොමෝ සෙමෙන් ගලා බසින්නී ය.
iii. ගුරුවරුන් ද ශිෂ්‍යයෝ ද රැස්වීමට ආහ.
iv. මම හෝ තොපි හෙට චාරිකාවට සහභාගී වෙමු.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

v. සුප්‍රකට පඬිරුවනක් වූ එතුමා ජනහද දිනූ නායකයෙක් ද වෙයි.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

i. වෛද්‍යවරයා සන්සුන් සිතින් අප සැනසීය.
ii. ගුරුවරු මහත් කැපවීමෙන් සිසුන්ට අධ්‍යාපනය ලබා දෙති.
iii. ඔහු ඉතා බැතිමත් ව දේව පූජාවන් පවත්වයි.
iv. අගමැතිතුමා එම සමුළුව නියෝජනය උදෙසා නියෝජිතවරියක යැව්වේ ය.
v. පෙර දින රාත්‍රී උත්සවයේදී මම තා දුටුවෙමි.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. විභාගය ඉහළින් සමත් වීමට නම් (සිසුහු සිසුන්) වීර්යයෙන් වැඩ කළ (යුතුය/යුත්තාහ)
ii. යහපත් (මිතුරෝ/ මිතුරන්) විසින් (සතුන්/ සත්තු) ආරක්ෂා කෙරෙති.
iii. (දේශප්‍රේමීන්/දේශප්‍රේමීහු) දේශය ආරක්ෂා (කරයි/කරති)
iv. (දියණියෝ/ දියණියන්) සමඟ පියාණෝ ගෙවත්ත අලංකාර (කළහ /කළාය).
v. (ඔවුන් /ඔවුහු) හෙට ආයතනයට පැමිණියහොත් සුදුසු බව සංවිධායකයෝ (සිතුහ/ සිතයි).

(ලකුණු 5x3=15)

5. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංග දක්වා ඇත. ඒවායේ අනු අංගය දක්වන්න.

i. **කවියකු** ලෙස **පතළ** කීර්තිය කරනකොට ඔහු **තෙදැති** මිනිසෙක් විය.
(කවියකු- තද්ධිත, පතළ - කෘදන්ත, තෙදැති - සන්ධි)

ii. **සුගන්ධ** යුත් **පියුම්හු** ලොවට සතුට **දෙමින්** පුබුදු වෙති.
(සුගන්ධ - උපසර්ග, පියුම්හු- විභක්ති, දෙමින් - ක්‍රියාපද)

iii. දේදුනු **වන්** **දෙබැම** ඇගේ **මුහුණේ** සුන්දරත්වය වැඩිකරයි.
(වන් - නිපාත, දෙබෑම - සමාස, මුහුණෙහි - විභක්ති)

iv. **දෑතෙහි** වළලු **පළඳා** **නටන** දැරිය ප්‍රීතියෙන් ඉපිලෙයි.
(දෑතෙහි - සන්ධි, පළඳා - ක්‍රියාපද, නටන - කෘදන්ත පද)

v. **ගුරුපදේශ** **වනාහි** **සිසුදිවිය** සරු කෙරෙන විදුරුමිණකි.
(ගුරුපදේශ - සන්ධි, වනාහි - නිපාත, සිසු දිවිය - සමාස) **(ලකුණු** 3x5=15)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැලපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරින් තෝරා ලියන්න.

i. හෙළ වියරණයෙහි සිදත් සඟරා අරුත්..... වඩා සුපැහැදිලි බවින් යුතුය.
ii. ධර්ම..... දෙලොව ම ආලෝකවත් කිරීමට සමත් ය.
iii. ස්වභාව ..... චමත්කාරජනක නිර්මාණ ලොවට දායාද කරයි.
iv. අර්ථ..... පරිපූර්ණ වූ පැරණි සිංහල ග්‍රන්ථ බොහෝය.
v. ලෝ ..... මෙලොව සියල්ලන්ටම පොදුය.
vi. හිරු..... විහිදුවාලන දිනකර ලොව අසිරිමත් කරයි.

(ධර්ම, දහම, රැස්, රශ්මිය, විවරණය, විග්‍රහය)

(ලකුණු 1/2 × 6 = 3)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(ආ) පහත දක්වා ඇති පද විසන්ධිකර ලියන්න.

i. හත්තඩිය
ii. අභ්‍යවකාශ
iii. යථාර්ථය
iv. ගුරුළිඳු
v. ගුරුවක්ෂර
vi. බළලුන්ගේ
vii.

(ලකුණු 1/2 × 6 = 3)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. වරද නැති **කෙනෙක්** නැත **සකිය** මේ **ලොවේ**.
ii. **රනින්** බැඳි මාල **ඔබගේ** ගෙලෙහි පළඳම්.
iii. **ලොවෙහි** ඇති හොඳම දේ **දරුවන්ට** ය.

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

හෙතෙම බෑගය අතට ගෙන නිවසෙන් පිටව යද්දී පුතේ, අනේ ගෙදර නවතින්නැ යි මැහැල්ල කෑගසා කීවා ය. තවදුරටත් මා නවතින්නෙ කුමකටද අත්තම්මේ මා ඉතින් යන්නට යමි.

(ලකුණු 1/2 × 6 = 3)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.
ගුරුතුමනි, "මම අද පටන් හොඳින් ඉගෙන ගනිමි"යි කමනි කීවාය.
"අද පටන් පාසලෙහි කසල නොදමමු" යි ඔවුහු කීහ.
"දරුවෝ නිරතුරු පිළිසිදුව සිටිය යුත්තෝ " යැයි මව පැහැදිලි කළාය.

(ලකුණු 1/2 × 6 = 3)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිරිත් සජ්ඣායනාව යනු බුදුරජාණන් වහන්සේ පාළි භාෂාවෙන් දේශනා කරන ලද සූත්‍ර ධර්ම බැතිමතුන්ගේ ආරක්ෂාව සඳහා ආශිර්වාද අපේක්ෂාවෙන් දේශනා කිරීමයි. සෑම පෙදෙසකම විශේෂයෙන් ම පාලි භාෂාවෙන් සජ්ඣායනය කරනු ලැබූ ථේරවාදී බෞද්ධ රටවල පවත්වනු ලබන පිරිත් දෙසුම මා හැඟී ඉතා ප්‍රසිද්ධ බෞද්ධ ශාන්ති කර්මයයි. බුදුන්ගේ ශ්‍රාවකයන් විසින් තෝරා ගනු ලැබූ උන්වහන්සේගේ මුල් දේශනා ඇතුළත් වැදගත් සූත්‍ර රැසකි. අවුරුදු දෙදහසකට පමණ පෙර තල්පත්වල ලියැවුණු මුල් සූත්‍ර පසු කාලයේදී ඇතුළත් කොට පිරුවානා පොත් වහන්සේ නමින් ග්‍රන්ථයක ලියැවිණි.**මජ්ඣිම**, **සංයුක්ත**, **අංගුත්තර**, **ඛුද්දක**, යන නිකාය ග්‍රන්ථවලින්, ආරක්ෂාව සඳහා බෞද්ධයින් **සජ්ඣායනා** කරනු ලබන සූත්‍ර පිරිත් **දේශනාවේ** අන්තර්ගතය.මෙහි ආරක්ෂාව යනුවෙන් අදහස් කරන්නේ අප විවිධ ආකාර නපුරු දෘෂ්ටි දුර්භාග්‍යයන් ලෙඩ රෝග හා ග්‍රහ අපලයන්ගෙන් වන උපද්‍රව මගහැරවීමට හා අප සිත් තුළ තදින් භක්තියක් හා විශ්වාසයක් ඇති කරවීම ය.

i. ඡේදයේ **තද කළු අකුරින්** මුද්‍රිත පද අකාරාදී පිළිවෙලින් ලියන්න.
ii. කෘදන්ත පද තුනක් උපුටා ලියන්න.
iii. බැඳි අකුරු සහිත වචන දෙකක් උපුටා ලියන්න.
iv. ග්‍රන්ථයකින් ඛුද්දක, ථේරවාදීයන වචනවල යෙදී ඇති පිල්ලම් වෙන වෙනම ලියන්න.
v. මෙම ඡේදයේ ඇතුළත් අර්ධ ස්වර සහිත වචන දෙකක් ලියා දක්වන්න. **(ලකුණු 15)**

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. අර්ධ අනුනාසික්‍ය අක්ෂර
ii. සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය
iii. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද
iv. භාව කෘදන්ත පද
v. ද්විත්ව රූප සන්ධිය

(ලකුණු 3x5=15)

SLGURU.LK
For Educational Purpose Only

“The only person who is educated is the one who has learned how to learn and change.” — Carl Rogers

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.